# සාරාංශය

විශ්ව ගම්මාන සංකල්පය දෙසට පිය නඟන වර්තමාන යුගය, ළමා පරපුරට විධිමත් අධ්‍යාපනයක් ලබා දිය යුතු බව අවබෝධ කර ගෙන ඇත. සාර්ථක දිවි පැවැත්මකට පදනම අධ්‍යාපනය වන හෙයින්, සමස්ත ළමා පරපුරට නිදහස් අධ්‍යාපනයක් ලබාදීමට එක්සත් ජතීන්ගේ සංවිධානය විශේෂ අවධානය යොමු කර ඇත. පාසල් යායුතු වයසේ පසුවන සියලුම ළමුන් හට නිදහස් හා අනිවාර්ය අධ්‍යාපනයකට ඉඩකඩ සලසා දීමට, ශ්‍රී ලංකා රජය ද ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සමාන ප්‍රතිපත්තීන් අනුගමනය කරයි.

ළමා අධ්‍යාපනයේ සාර්ථක සහ අසාර්ථක පැතිකඩයන් පිළිබඳව අවධානය යොමු කිරීමේදී, ළමා නිවාසයන්හි සුරකුම ලබන ළමුන්ගේ අධ්‍යාපනයේ ස්වභාවය වෙත අවධානය යොමු කිරීම වැදගත් වන්නේය. විවිධ සමාජයීය හේතුන් මත විසිරුණු පවුල් වල, දෙමාපිය රැකවරණය අහිමි වූ, අසරණවූ, අනාථ වූ, අවාසිදායක ළමුන් හට සාර්ථක අධ්‍යාපනයක් ලබාදීමෙන් ඔවුන්ගේ අනාගතය වඩාත් තිරසාර මඟකට යොමු කළ හැකිව ඇත. මෙවැනි ළමුන් හට ඵලදායී අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති ගැටළු, ප්‍රශ්ණ හඳුනා ගෙන, එම ගැටළු අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරමින්, උසස් අධ්‍යාපනය තෙක් සාර්ථක අධ්‍යාපනයක් ලබා ගැනීමට යොමු කරවීම මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේය.

විවිධ පර්යේෂකයන් විසින් නිවාසගත ළමුන් පිළිබඳව හා ඔවුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් පිළිබඳ විවිධ පර්යේෂණ ගණනාවක් සිදු කරනු ලැබ ඇත. ළමා නිවාස වල සුරකුම ලබමින් අධ්‍යාපනයේ යෙදී සිටින ළමුන්ගේ අධ්‍යාපන සාධනය පහළ මට්ටමක පවතින බව දෙස් විදෙස් විවිධ පර්යේෂණ මගින් හෙළි වී ඇත.

තෝරා ගත් ළමා නිවාසයක ද්විතීයික මට්ටමේ ඉගෙනුම ලබන ළමුන්ගේ අධ්‍යාපනය සාධනයේ ස්වභාවය විමර්ශනය කිරීම ද ළමා නිවාසයේ සහ පාසලේ මානව පරිසරය සහ භෞතික පරිසරයන් ළමුන්ගේ අධ්‍යාපනය කෙරෙහි ලබා දෙන දායකත්වය සොයා බැලීම ද, අධ්‍යාපනය ලැබීමේදී මෙම ළමුන් මුහුණ දෙන ගැටළු, හඳුනා ගැනීම ද එම ගැටළු අවම කර ගැනීම ද යෝජනා ඉදිරිපත් කරමින් සාර්ථක ඉගෙනීමකට අවස්ථාව සපයා දීම ද අධ්‍යාපනය සඳහා අවශ්‍ය සුසධ්‍යකරණයන් සැපයීමට යෝජනා ඉදිරිපත් කිරීම ද මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේය.

ඉහත අධ්‍යයනය සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමය යොදා ගනු ලැබීය. එක් ළමා නිවාසයක් පමණක් පදනම් කරගෙන, එම නිවාසයේ ළමුන්ගේ අධ්‍යාපන සාධනය විමසා බලා, එය කෙරෙහි බලපාන සාධක පිළිබඳ බහුවිධ දත්ත රැස්කිරීමේ ක්‍රම භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. එම නිවාසයේ 7 සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉගෙනීමේ යෙදී සිටින ළමුන් 55 දෙනෙක් ළමා නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදී. එලෙසම එම ළමුන් ඉගෙනුම ලබන පාසලේ විදුහල්පති එම ළමුන් අයත් වන ශ්‍රේණි භාර ගුරුභවතුන් සහ සිංහල, විද්‍යාව, ගණිතය, සමාජ අධ්‍යයනය සහ

සෞන්දර්ය විෂයයන් උගන්වනු ලබන ගුරු භවතුන් ද නියැදියට අන්තර්ග්‍රහණය කර ගනු ලැබීය. ළමා නිවාසයේ පාලිකාවෝ සියලුම දෙනා ද නියැදියට ඇතුලත් වූහ.

නියැදියේ ළමුන්ගේ 2004 සහ 2005 වසරවල අවසාන වාර විභාගයෙ , තෝරාගත් විෂයයන් සඳහා ලබාගත් ලකුණු වාර්තා හා ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු සමීක්ෂණය කරන ලදී. නිරීක්ෂණ පත්‍රිකා භාවිත කර ළමා නිවාසයේ සහ පාසලේ මානව සහ භෞතික පරිසරය නිරීක්ෂණය කරන ලදී. වඩාත් ගැඹුරට කරුණු අධ්‍යයනය කිරීම සඳහා අහඹු ලෙස තෝරා ගන්නා ලද ළමුන් 20 ක් සමඟද, විදුහල්පති, ගුරුභවතුන් හා පාලිකාවන් සමඟද සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. මෙවැනි බහුවිධ ක්‍රම ශිල්ප භාවිතයෙන් රැස්කර ගන්නා ලද දත්ත සංඛ්‍යාත්මක හා ගුණාත්මක ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරනු ලැබීය.

මෙම ළමුන් අධ්‍යාපන සාධනය සෞන්දර්‍ය විෂයයන් සඳහා ඉහළ මට්ටමක තිබිණි. සියලුම ශ්‍රේණිවල ළමුන් තුළින් මෙම නැඹුරුව වඩාත් කැපී පෙනෙන්නට ද තිබිණි. මනස වෙහෙසන සංකල්ප ඉගෙනීමට ඇති අකමැත්ත මත ගණිතය, විද්‍යාව, වැනි විෂයයන් සඳහා ලබා තිබුණේ අඩු සාධන මට්ටමකි. 11 ශ්‍රේණියේ ළමුන් විෂයයන් සඳහා ලබා සිටි සාධන මට්ටම, 7 8, 9 ශ්‍රේණිවල ළමුන්ගේ මට්ටම වඩා ඉදිරියෙන් පැවතිනි.

පාසලේ සහ ළමා නිවාසයේ භෞතික පරිසරය හොඳ තත්ත්වයේ තිබූ අතර, අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ප්‍රමාණාත්මක තත්ත්වයක තිබූ බව පෙනිනි. ළමා නිවාසයේ පුස්තකාල පහසුකම් නොතිබීම, ළමුන්ගේ අධ්‍යාපනයට බෙහෙවින්ම බලපාන බව හඳුනා ගන්නට හැකි විය. පුවත් පත් සඟරා සහ විද්‍යුත් උපකරණ, නිවාසය තුල ළමුන්ගේ භාවිතයට ලබාදී තිබිණි.

බොහෝ ළමුන් විවිධ මානසික ගැටළුවලින් පීඩා විඳින තත්ත්වයක් අනාවරණය විය. ඔවුන්ගේ විසිරුණු පවුල් පරිසරයෙන් ලැබුණු අතීත අත්දැකීම් මෙම ළමුන් මෙවැනි තත්ත්වයකට පත් කර තිබුණි. තම පවුලේ තොරතුරු සමාජයට අනාවරණය වේ යැයි පවතින බිය නිසා, සමාජමය ජීවිතයට නැඹුරුවක් ඔවුන් තුලින් දිස් නොවිනි.

මෙම ළමුන් වෙත විශේෂ සැලකිල්ලක් දක්වන ගුරුභවතුන්ට, ඔවුන් තුළ පැවති කැමැත්ත, එම ගුරුවරුන්ගේ විෂයයන් ඉගෙනීමේදී වඩාත් කැපී පෙනුනි. මෙම ළමුන් බොහෝ දෙනෙක් වැඩි සාධනයක් ලබා සිටියේ එවැනි ගුරුවරු විසින් උගන්වනු ලබන විෂයයන් සඳහාය. දඬුවම් ලබාදෙන, රළු ගති ස්වභාවයයන් ඇති ගුරුවරුන්ගේ ඇසුරින් ඔවුන් දුරස්ව සිටින බවත් අනාවරණය විය.

පාලිකාවන් සහ මෙම ළමුන් අතර පවතින සහසම්බන්ධය සාමාන්‍ය මට්ටමක පැවතුනි. පාලිකාවන්ගේ පවුල් පසුබිම හා ඔවුන් ලබා සිටි අධ්‍යාපන මට්ටම නිවාසගත ළමුන්ගේ අධ්‍යාපනයට බෙහෙවින් බලපෑම් ඇති කරන බව හඳුනා ගන්නා ලදී. ළමා නිවාසගත පරිපාලන කටයුතු සඳහා, එම පාලිකාවන් සියලු දෙනාම සුදුස්සන් නොවන බව අවබෝධ විය.

ළමුන්ගේ අනාගත රැකියා අපේක්ෂණ හා විෂය සාධනය අතර ද සම්බන්ධතාවයක් දිස් විය. ළමුන්ගෙන් 86% කටම රැකියා අපේක්ෂණ තිබිනි. ඔවුන් පහළ සාධන මට්ටමක්

පෙන්නුම් කරන දුර්වල විෂයයන් සඳහා වැඩි අවධාරණයක් යෙද විය යුතු බව පෙනී යයි. දුර්වල විෂයයන් සඳහා පාසල හා නිවාස මට්ටම් ඉගෙනුම් උපකාර ලබාදීම ඉතා වැදගත්වේ.

පාසලේ සහ නිවාසයේ පරිසර, ඉගෙනුම් මධ්‍යස්ථානයක ස්වභාවයන් දිස් විය යුතුය. අධ්‍යාපනය සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමත්, ඉගෙනීම කෙරෙහි උනන්දු කරවීමට උපස්ථම්භන ලබාදීමත් අවශ්‍යවූවකි. සාර්ථක අධ්‍යාපනයක් ලබා ගැනීමට නම් ළමුන්ගේ මනස අතුරු බාධක වලින් නිදහස් විය යුතුය. ඒ සඳහා අවශ්‍ය නිසි උපදේශන සේවාව, පාසල සහ නිවාස මට්ටමින් , ළමුන්ගේ අවශ්‍යතාවය පරිදි සංවිධානය කිරීම තවත් වැදගත් කරුණකි. මෙම ළමුන්ට අධ්‍යාපනය ලබා දෙන ගුරු භවතුන් දැනුවත් කර ළමුන් වෙත කාරුණිකව කටයුතු කිරීමට යොමු කිරීමෙන්, සෑම විෂයයක් කෙරෙහිම ඉහළ සාධන මට්ටමක් කරා ඔවුන් ලඟා කළ හැකිය.

නිදහස් අධ්‍යාපනයක් ලබාදෙන සියලුම පහසුකම් ලබා ගනිමින්, අනාගත රැකියා අපේක්ෂා ළමුන් තුළ ඇති කිරීමට ඔවුන් දැනුවත් කිරීමත්, අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීමත් විය යුතුය.

ළමා නිවාසයේ තෝරාගත් නියැදිය පදනම් කරගෙන සිදු කරන ලද අධ්‍යයනය මඟින් ලබාගත් නිගමන සහ යෝජනා ඉදිරිපත් කර ඇත. එම යෝජනා භාවිත කරමින්, ළමා නිවාස ළමුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම ඉහළ නැංවීමට දායකත්වයක් ලබා ගත හැකිය.

[library stamp]